## ඒ ජී ඩේවිඩ් එ. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 133/2018 (2018.04.26 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ඒ ජී ඩේවිඩ් මහතා
**නොතීසිලත් පාර්ශවය** - කොමසාරිස්, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

| | | | |
|---|---|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.09.20 | 2017.10.16 | 2017.10.31 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 28.09.2017 (ලැබුණු බව දැන්වීම) , 29.09.2017, 14.11.2017 | 2017.11.02, 2017.11.14, 2017.01.05 | 2017.11.02, 2017.11.14 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.11.14(නමුත් පොදු අධිකාරිය මෙවැනි අභියාචනයක් තම වෙත ලැබී නැති බව දන්වා සිටියි) | | |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | - | - | - |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 09.01.2017 | 09.01.2017 | 09.01.2017 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක 2017.09.20, 2017.10.16 සහ 2017.10.31 දිනැතිව ඉල්ලා සිටින තොරතුරු සහ ඒ සඳහා පොදු අධිකාරිය දක්වන ලද ප්‍රතිචාරය/ ගන්න ලද ක්‍රියාමාර්ග පිළිවෙලින් පහත පරිදි වේ.

<u>2017.09.20 දිනැති තොරතුරු ඉල්ලීම:</u>

*ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු ක්‍රියාදාමය සඳහා වන සම්පූර්ණ විස්තර*

පොදු අධිකාරිය 2017.09.29 දින පනතේ 27(3) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන ආකාරය විමසා තිබුනද අභියාචක එයට පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බව පොදු අධිකාරිය පවසා සිටියි. 2017.11.14 දිනැතිව පොදු අධිකාරිය තවදුරටත් ප්‍රතිචාර දක්වමින් සඳහන් කර ඇත්තේ කුමන නිලධාරීන් කාණ්ඩය සම්බන්ධ ස්ථාන මාරු ක්‍රියාදාමය පිළිබඳව විමසන්නේද යන්න නිශ්චිතව සඳහන් කර නොමැති බැවින් තොරතුරු ප්‍රතික්ෂේප කරන බවයි.

<u>2017.10.16 දිනැති තොරතුරු ඉල්ලීම:</u>

1. *වර්ෂ 2017/2/7 දිනය වන විට ක්‍රියාත්මක වෙමින් තිබූ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමතව තිබුනේද යන්න*
2. *වර්ෂ 2017/2/7 දිනය වන විට ප්‍රජා විශෝධන කොමසාරිස් ධූරය දැරූ වත්මන් කොමසාරිස් වී ප්‍රේමචන්දිරන් මහතාගේ වැඩ බලන කොමසාරිස් පත්වීම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත වී තිබුනේද යන්න*

පොදු අධිකාරිය 2017.11.14 දිනැතිව 2017.10.16 දිනැති තොරතුරු ඉල්ලීමෙහි අංක 1ට පිළිතුරු සපයා ඇති අතර අංක 2 සම්බන්ධයෙන් දන්වා ඇත්තේ, දැනට එම පත්වීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් එම අනුමැතිය ලැබුණු විගස එම ලිපියෙහි පිටපතක් අභියාචක වෙත යොමු කරන බවත්ය.

<u>2017.10.31 දිනැති තොරතුරු ඉල්ලීම:</u>

*ස්ථාන මාරු පටිපාටියේ අනුමත වූ පිටපත සහ කොමසාරිස්වරයාගේ වැඩ බැලීමේ පත්වීම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත වූ ලිපියේ පිටපත*

පොදු අධිකාරිය 2017.11.02 සහ 2017.01.05 දිනැති ලිපි මගින් මෙම තොරතුරු තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බැවින් ඉල්ලීම ප්‍රතික්ෂේප කර සිටින ලදී.

## අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

කොමිෂන් සභාවේ නොතීසි වලට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය සපයා ඇති 2018.04.20 දිනැති පිළිතුර මගින් පෙනී ගියේ පොදු අධිකාරිය නිසි අයුරින්

අභියාචකගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වා ඇති බවයි. අභියාචක නොතීසි වලට ප්‍රතිචාර දක්වා නොතිබිණි.

**නියෝගය:**

අංක DCBC/DEV/4/9 දරණ 201804.20 දිනැතිව අභියාචක වෙත පිටපතක් සහිතව පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද ලිපියට අනුව සහ අභියාචක විසින් ගොනු කරන ලද අභියාචනයට අදාළ ලියකියවිලි පරීක්ෂා කර බැලීමෙන් ප්‍රමාණවත් පිළිතුරක් ලැබී ඇති බවට තීරණය කර සිටිමු.
අභියාචනය මෙයින් අවසන් කරනු ලැබේ.

..........................................................
**සභාපති** - මහින්ද ගම්මම්පිල

..........................................................
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා

..........................................................................
**කොමිෂන් සභා සාමාජික**- ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් (Dr. Selvy Thiruchandran)

..........................................................
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

*****